රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 27/99

මගේ අංකය: ආ1/543ඊ/01/30(ii)ආ
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1999.11.30 වෙනි දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II වන පන්තියේ "ආ" ඛණ්ඩයේ සිට II වන පන්තියේ "අ" ඛණ්ඩයට 1994.07.01 සිට 1996.12.31 වන දින දක්වා කාලය තුළ උසස් කරන ලද නිලධාරින්ගේ**
**<u>වැටුප් පරිවර්තනය කිරීම</u>**

1994.07.01 දින සිට අංක: 27/94 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මගින් මධ්‍යම මට්ටමේ කාර්මික සේවය ප්‍රතිව්‍යුහගත කිරීමේදී එම සේවයේ III වන පන්තියේ සිට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II "ආ" කණ්ඩයට අන්තර්ග්‍රහණය කරන ලදුව 1994.07.01 සිට 1996.12.31 දින දක්වා කාලය තුළ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II "ආ ඛණ්ඩයේ සිට II "අ" ඛණ්ඩයට උසස්වීම් ලැබූ නිලධාරින්ගේ 1996.12.31 දිනට ලැබූ වැටුප 1997.01.01 පරිවර්තනය කිරීමේ දී නිෂමතාවයක් පැන නැගී ඇති බව වාර්තා වී ඇත.

02. මෙම විෂමතාවය ඉවත් කිරීම සඳහා, එම නිලධාරීන්ට මධ්‍යම මට්ටමේ කාර්මික සේවයේ III වන පන්තිය සඳහා අංක: 37/92 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් එස්-3-1 වැටුප් පරිමාණය උසස් වු දිනය දක්වා දිගටම ක්‍රියාත්මක වුවා සේ සැලකිය යුතුය. අනතුරුව ඔවුන් මධ්‍යම මට්ටමේ කාර්මික සේවයේ II "ආ" ඛණ්ඩයට උසස්වු ලෙස සලකා එසේ උසස් වු දින සිට අංක: 37/92 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ එස්-3-2 වැටුප් පරිමාණයට ඔවුන්ගේ වැටුප් පරිවර්තනය කළ යුතුය. තවද ඔවුන් 1996.12.31 දක්වා වැටුප් වර්ධන උපයා ගෙන ඇත්නම් මධ්‍යම මට්ටමේ කාර්මික සේවයේ II "ආ" ඛණ්ඩයට අදාල වු වැටුප් පරිමාණයේ එම වැටුප් වර්ධකවල අගයන්ද කල්පිත පදනමින් එකතු කල යුතුය. එක් එක් නිලධාරියාට 1997.01.01 දින සිට අදාල වන 40% වැඩිවීම යටතේ ගෙවිය යුතු වැටුප තීරණය කිරීම සඳහා සංශෝධිත පදනම අනුව 1997.01.01 දින සිට හිමිවන වැටුපට අනුරූපී වු 1996.12.31 දිනට කල්පිත වැටුප (අංක: 2/97(III) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 73 පිටුවේ සඳහන් ටී-3-2-1 වැටුප් කණ්ඩයේ 1996.12.31 දිනට අනුරූපී වන වැටුප් පියවර කල්පිතව) යොදා ගතයුතුය.

උදා : "එ" නමැත්තා අංක: 37/92 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි එස්-3-1 වැටුප් පරිමාණයේ ම.ම.කා.සේ. III වන පන්තියේ නිලධාරියකු වශයෙන් 1994.02.08 දිනට රු: 34080/- වැටුප් පියවර ලබමින් සිටියේය. අංක: 27/94 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මගින් මොහු 1994.07.01 දින ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II "ආ" ඛණ්ඩයට අන්තර්ග්‍රහණය කරන ලද අතර රු: 30060-5x660-11x780-41940 වැටුප් පරිමාණයේ රු: 37260/- වැටුප් පියවරේ එදින සිට පිහිටුවන ලදී. 1995.02.08 සහ 1996.02.08 දින වේතනාධිකයක් ද සමග රු: 38820/- ලබමින් සිටියදී 1996.09.30 වෙනිදින සිට රු: 37200-4x780-14x1200-57120 වැටුප් පරිමාණය අදාල වු ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II "අ" ඛණ්ඩයට උසස් කරන ලදී. ඒ අනුව ඔහුට වැටුප් ගෙවා ඇත්තේ මෙසේය.

| දිනය | වැටුප් පරිමාණය | සේවය හා ශ්‍රේණිය | වැටුප් පියවර | චක්‍රලේඛය |
|---|---|---|---|---|
| 1994.02.08 | රු:27120-7x660-10x780-39540 | ම.ම.කා.සේ.III | රු:34080 | රා.පරි.ච.37/92 |
| 1994.07.01 | රු:30060-5x660-11x780-41940 | ශ්‍රී ලං.තා.සේ.II "ආ" | රු:37260 | රා.පරි.ච.27/94 |
| 1995.02.08 | - එම - | ශ්‍රී ලං.තා.සේ.II "ආ" | රු:38040(වැ.ව.) | " |
| 1996.02.08 | - එම - | - එම - | රු:38820( " ) | " |
| 1996.09.30 | රු:37200-4x780-14x1200-57120 | ශ්‍රී ලං.තා.සේ.II "අ" | රු:40320රා.පරි.ච.27/94<br>(වැටුප් පරිවර්තනය; හා 11/94 | |

| | | | | |
|---|---|---|---|---|
| 1997.01.01 | රු:58440-1x1320-13x1560-80040 | ශ්‍රී ලං.තා.සේ. II"අ" | රු:64440* | රා.පරි.ච.2/97(iii) |
| 1998.01.01 | - එම - | - එම - | රු:66000* (97.09.30 වැටුප් වර්ධකය සමඟ) | " |

*1997.01.01 සිට ගෙවන වැටුප 40% වැඩිවීමට යටත්වය.

මෙම නිලධාරියා උසස්වීම නොලබා සිටියේනම් ලැබිය හැකිව තිබු වැටුප මෙසේය.

| දිනය | සේවය හා ශ්‍රේණිය | වැටුප විස්තර | චක්‍රලේඛය |
|---|---|---|---|
| 1994.02.08 | ම.ම.කා.සේ. III | රු: 34080 | (රා.පරි.ච.37/92) |
| 1994.07.01 | ශ්‍රී ලං.තා .සේ. II "අ" | රු: 37260 | (රා.පරි.ච.27/94 |
| 1995.02.08 | - එම - | රු: 38040 | (රා.පරි.ච.27/94) |
| 1996.02.08 | - එම - | රු: 38820 | (රා.පරි.ච.27/94) |
| 1997.01.01 | ශ්‍රී ලං.තා .සේ. II අ | රු: 68880* | (රා.පරි.ච.2/97(III) |
| 1997.02.08 | - එම - | රු: 70440* | (රා.පරි.ච.2/97(III) |

*1997.01.01 දිනට ගෙවන වැටුප 40% වැඩිවීමට යටත්වය.

ඉහත දැක්වෙන විෂමතාවය ඉවත් කිරීම සඳහා මෙම වැටුප් පරිවර්තනය කල්පිත වශයෙන් නැවත සකස් කළ යුත්තේ පහත දැක්වෙන පරිදිය.

| | | |
|---|---|---|
| උසස්වීම ක්‍රියාත්මක වීමට පෙර අදාල වු වැටුප් පරිමාණය (එස්-3-1 රා.පරි.ච. 37/92) | ම.ම.කා.සේ.III | -රු. 27120-7 x660-10x780-39540 |
| උසස්වීම ක්‍රියාත්මක වීමට පෙර ලබමින් සිටි වැටුප් පියවර | ම.ම.කා.සේ.III | -රු. 35640 (කල්පිත) |
| රා.පරි.ච.11/94 අනුව උපයාගත් කොටස ද සමඟ වැටුප | ම.ම.කා.සේ.III | -රු. 36140 (කල්පිත) |
| උසස්වු තනතුරේ වැටුප් පරිමාණය (එස්-3-2 රා..පරි.ච.37/92) | ම.ම.කා.සේ.II"අ" | -රු. 29760-3x660-11x780-40320 |
| උසස්වීම යටතේ පරිවර්තිත වැටුප(96.09.30) | ම.ම.කා.සේ.IIඅ | -රු.37200 |
| රා.පරි.ච. 2/97(iii) අනුරූප වැටුප | ශ්‍රී ලං.තා.සේ.II | -රු.73800 |
| 1997.01..01 ගෙවිය යුතු වැටුප (40%වැඩිවීම යටතේ) | -එම- | -රු.64224 |
| 1997.09.30 වැටුප (වැ.ව. උපයා ගෙන ඇත්නම්) | -එම- | -රු. 65784 |
| 1998.01.01 වැටුප (60% වැඩිවීම සමඟ) | -එම- | -රු. 75360 |

03. මෙම නිලධාරින්ට 1996.12.31 දක්වා දැනටමත් ගෙවා ඇති වැටුපෙහි කිසිදු වෙනසක් සිදු නොවිය යුතුය.

04. මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිව මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

(අත්සන)

**මහින්ද බන්දුසේන**
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය